*සැ. යු.* - 2023.04.08 දින පළ කරන ලද අංක 2344 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,345 - 2023 අගෝස්තු මස 11 වැනි සිකුරාදා - 2023.08.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 838 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 සැප්තැම්බර් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අගෝස්තු මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග විභාග ප්‍රතිඵල ආදිය

**බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය -2023**

බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාර ව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන් සඳහා පළාත් පදනම මත බඳවා ගැනීම සිදුකරන අතර පවතින ප්‍රතිපාදන හා සේවා අවශ්‍යතාවය මත බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. 2023.06.30 දින වන තෙක් පවත්නා පුරප්පාඩු සඳහා තරග විභාගයේ ලකුණු සහ ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල එකතුව අනුව, ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ මුළු කුසලතාවයේ අනුපිළිවෙල මත බඳවා ගැනීම් කටයුතු සිදුකෙරේ.

02. වැටුප් ක්‍රමය -

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016(iv) හි ජී-ඊ-1-2016 - ඒ දරන වැටුප් ඛණ්ඩයට අදාළව රු. 31490 - 6x445 -7x525 -2x600 -රු. 39,035/= වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ 14 පියවර වන රු. 37,835/- වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.

03. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් -

3.1 අධ්‍යාපන සුදුසුකම් -

i. ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂි කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපලේඛන 01හි සඳහන් කර ඇති විෂයයන්ට අදාළ උපාධියක් ලබා තිබිය යුතුය. මෙම උපාධිය අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ලබාගත් වලංගු උපාධියක් විය යුතුය.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී මව්බස සහ ගණිතය සඳහා සාමාර්ථයන් සහිත ව සම්මාන තුනක් සමග විෂයයන් හයක් (06) සමත් වීම. (එක් වතාවක දී අවම වශයෙන් විෂයයන් පහක් (05) සමත් වී තිබිය යුතුය.)

සහ

iii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනක් (03) සහිත ව එම විභාගය සමත් ව තිබිය යුතුය.

**ඉතා වැදගත් :** (ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී සැලකිල්ලට ගත යුතුය. )

- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කල හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතු ය.
- උපාධියට හඳාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකි ය.
- ඉල්ලුම් කල හැක්කේ එක් විෂයයක් සඳහා පමණි.
- ඉල්ලුම් කළ විෂයය හා මාධ්‍යය කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.

3.2 *කායික හා මානසික යෝග්‍යතාවය -*

සෑම අපේක්ෂකයෙකු ම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.3 *වයස.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

3.4 *වෙනත් සුදුසුකම් -*

i. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරු/අයදුම්කාරිය විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතු ය.
iv. පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරු හෝ කලත්‍රයා, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු බස්නාහිර පළාත තුළ ස්ථිර අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතු ය. (ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස්.04) මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු ය.)

04. *සේවා කොන්දේසි.-*

i. රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද, යටත්ව තෝරාගනු ලබන උපාධිධාරී අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1(අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

ii. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම්ලාභීන් යටත් විය යුතු ය.

iii. මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

iv. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව උසස් වීම් සිදු කරනු ලැබේ.

v. 2020.10.16 දිනැති රා.ප.ච. 18/2020 හා එයට වරින් වර සිදු කරන සංශෝධනයන්ට අනුව නියම කර ඇති පරිදි දෙවෙනි රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

05. *බඳවා ගැනීම.-*

5.1 බඳවා ගැනීමේ ක්‍රමය :

2008.07.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.4 වගන්තිය අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

තෝරාගැනීම් සඳහා ලිඛිත තරග විභාගයක් පැවැත් වේ.

ලිඛිත තරග විභාගයේ ඉහළ ම ලකුණු ලබා ගත් අයගේ අනුපිළිවෙල අනුව ඒ ඒ විෂයයට පළාත තුළ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පසුව ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත තරග විභාගයේ ලකුණු හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සඳහා තෝරා ගනු ලැබේ. (ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.3.1 වගන්තිය බලපැවැත්වේ.)

මෙම *ගැසට්* නිවේදනය ප්‍රකාර ව සිදුකරනු ලබන ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගැනීමේ කාලසීමාව **2023.06.30** දිනට නියමිත පුරප්පාඩු සඳහා පමණක් වලංගු වේ.

5.2 ලිඛිත තරග විභාගය - මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01 යි) | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම (කාලය පැය 01 යි) | 100 | 40 |

*විෂය නිර්දේශය :*

විෂයය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

අපේක්ෂකයා සතු ගුරු වෘත්තීය සඳහාවන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ය. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

විෂයය අංක 02 - සාමාන්‍ය දැනීම

ගුරු ක්ෂේත්‍රයට අදාළ ව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා/හෝ දේශීය වශයෙන් සිදුවී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

5.3 *විභාග පරිපාටිය -*

i. මෙම විභාගය සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.
ii. සෑම අපේක්ෂකයෙකු ම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට නියමිත භාෂා මාධ්‍යය ම විය යුතුය.
iii. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙ හි දැක්වෙන භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
iv. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙකටම (02) පෙනී සිටිය යුතු ය.
v. වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

5.4 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -*

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූල ව ප්‍රසිද්ධ කරනු ලබන *ගැසට්* නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ හෝ වෙබ් අඩවියේ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

5.5 *ප්‍රායෝගික පරීක්ෂණය -*

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත සඳහන් පරිදි ලකුණු හිමි වේ :

| *අනු අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම. | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය. | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව. | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය. | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය. | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය. | 25 | |

5.6 *ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය -*

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 05කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
ii. ප්‍රායෝගික පරීක්ෂණය ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.
iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබාගත යුතුය.
iv. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

5.7 *නිර්ණායකයන්හි අරමුණ.-*

i. අරමුණ හා ප්‍රවිශ්ට වීම.
සාර්ථකව පාඩමෙ හි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

ii. පෞරුෂය හා හඬ පාලනය.
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම.

iii. සන්නිවේදනයේ පැහැදිලි බව.
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

iv. කාල කළමනාකරණය
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම.

v. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය
අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව.

06. *විභාග ගාස්තු :*

විභාග ගාස්තු ලෙස රු. 600/-ක මුදලක් බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ අංක 20-03-02-99 ට බැර වන පරිදි බස්නාහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවීම්කර තමා නමින් ලබා ගත් **බ.ප. 01** කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය.

*බ.ප. 01 ආකෘතියේ* මුල් කුවිතාන්සිය හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සි හා මුදල් ඇණවුම් හෝ මුදල් කිසිවක් භාරගනු නොලබන අතර එවැනි කුවිතාන්සි ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද කිසිදු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බව ද සැළකිය යුතු ය. (මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.)

07. *අයදුම් කළයුතු පිළිවෙල :*

i. සියලුම අයදුම්කරුවන් නියමිත විභාග ගාස්තු ගෙවීමෙන් අනතුරුව www.psc.wp.gov.lk අපගේ නිල වෙබ් අඩවියට පිවිස අදාළ තොරතුරු ඇතුළත් කර අයදුම්පත පුරවා යොමු කිරීමෙන් (submit) අනතුරුව අයදුම්පත්‍රය බාගත කිරීම සිදුකළ හැකි ය. අයදුම්පත පිරවීමේදී යොමුකර ඇති උපලේඛන 01 උපයෝගී කරගත යුතු ය.

ii. මාර්ග ගත ක්‍රමය ඔස්සේ අයදුම්කර (Online) බාගත කර (Download) නොගන්නා ලද අයදුම්පත් හා පරිගණකය මගින් සකස්කර මුද්‍රණය කර ගන්නා ලද අයදුම්පත් සියල්ල දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.

iii. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමුකර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතෙ හි ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iv. අයදුම්කරනු ලබන විෂයය කිසිසේත් වෙනස් කරනු නොලබන අතර එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

අයදුම්පත සමග කිසිඳු සහතිකයක් අමුණා නොඑවිය යුතුය. මුදල් ගෙවීම කළ බවට කුවිතාන්සියේ මුල් පිටපත පමණක් අළවා එවිය යුතුය. (**අමුණා එවීම නොකළ යුතුය.**)

v. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-*

අයදුම්පතෙ හි හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කිරීමට බලයලත් අයකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරිවරයෙකු, රු.498,960/-ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ මාණ්ඩලික ශ්‍රේණියේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු හෝ යන අයවලුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කරනු ලැබ තිබිය යුතු අතර,අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

vi. මාර්ග ගත ක්‍රමය මගින් (Online) අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අවසාන දිනය - **2023.08.25**

vii. **2023.08.25** දිනට පෙර මාර්ග ගත ක්‍රමය මගින් අයදුම්කිරීමෙන් පසු බාගත කරන ලද යොමු අංකය (Reference No.) සහිත අයදුම්පත්, **අයදුම්කරුගේ අත්සන සහිතව හා අත්සන සහතිකකර ගැනීමෙන් අනතුරුව 2023.09.01** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

ලේකම්,
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ,
අංක 628 , 10 වන මහළ, ජන ජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

අයදුම්පත බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගුරු තනතුරට උපාධිධාරීන් බඳවා ගැනීම - 2023**" යන්න සහ **අයදුම් කරණු ලබන විෂයය** සඳහන් කළ යුතු ය.

08. තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු අයුරකින් සළකා බලනු නොලැබේ.

09. මෙම විභාගය කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසන් තීරණය හා මෙම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

10. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මගින් පළ කරනු ඇත. එම නිවේදනය පළ වී දින 07ක් හෝ ගතවූ පසුවත් විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය.ඔබ වෙත තබාගත් අයදුම්පතේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද සමගින් අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයෙන් විමසිය යුතුය.

11. විභාගය සඳහා අයදුම්කරනු ලබන සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කර ඇතැයි උපකල්පනය කර විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබාදෙනු ලැබේ. විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබාදීම සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැළකිය යුතුය. එසේ වුවද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට හා පත්වීම් ලබාදීම ප්‍රතික්ෂේප කිරීමේ බලය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

12. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

13. පත්වීම් ලිපියේ සඳහන් ව ඇති පත්වීම් දින සිට දින 14ක් ඇතුලත වැඩභාර ගැනීම සිදු කළ යුතු අතර, එසේ නොවුනහොත් නැවත දැනුම්දීමකින් තොරව පත්වීම අවලංගු වේ.

**උපලේඛනය 01**

පුරප්පාඩු ඇති විෂයයන්, පුරප්පාඩු ප්‍රමාණයන් හා මාධ්‍යයන් පහත දක්වා ඇත. ඒ අනුව ඉල්ලුම්කරනු ලබන විෂයය හා මාධ්‍ය තෝරා ගැනීම සිදු කළ යුතුය.

| විෂයය | විෂයය අංකය | අධ්‍යාපන සුදුසුකම් | මාධ්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | ඉංග්‍රීසි මාධ්‍ය |
| රසායන විද්‍යාව | 1 | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස හෝ අනෙකුත් විෂයක් ලෙස උපාධියේ මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස. (උසස් පෙළ) විෂය නිර්දේශයට අනුකූලවන පරිදි හදාරා තිබීම හෝ තුන් අවුරුදු උපාධියක දී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් අදාළ විෂයෙන් සම්පූර්ණ කර තිබීම. | 24 | 2 | 3 |
| භෞතික විද්‍යාව | 2 | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස හෝ අනෙකුත් විෂයක් ලෙස උපාධියේ මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස.(උසස් පෙළ) විෂය නිර්දේශයට අනුකූලවන පරිදි හදාරා තිබීම හෝ තුන් අවුරුදු උපාධියක දී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් අදාළ විෂයෙන් සම්පූර්ණ කර තිබීම. | 31 | 3 | 3 |
| ජීව විද්‍යාව | 3 | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස උද්භිත විද්‍යාව/ශාක ජීව විද්‍යාව හෝ සත්ව විද්‍යාව හදාරා තිබීම හා ප්‍රධාන විෂය උද්භිත විද්‍යාව/ශාක ජීව විද්‍යාව වනවිට අනෙක් විෂයක් ලෙස සත්ව විද්‍යාව ද ප්‍රධාන විෂය සත්ව විද්‍යාව වනවිට අනෙක් විෂයක් ලෙස උද්භිත විද්‍යාව/ශාක ජීව විද්‍යාව ද අවම වශයෙන් වසර දෙකකදී වත් උසස් පෙළ විෂය නිර්දේශයට අනුකූලව වන පරිදි හදාරා තිබීම හෝ තුන් අවුරුදු සාමාන්‍ය උපාධියකදී උද්භිත විද්‍යාව /ශාක ජීව විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයන් දෙකෙහි ම එකතුව, මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක බැගින් උසස් පෙළ විෂය නිර්දේශයට අනුකූල පරිදි හදාරා තිබීම. | 19 | 2 | 3 |
| කෘෂි විද්‍යාව | 4 | විද්‍යාවේදී කෘෂි තාක්ෂණය හා කළමනාකරණ උපාධිය (B.Sc. Agricultural Technology and Management) | 0 | 0 | 1 |
| සංයුක්ත ගණිතය | 5 | BSc graduate with Applied, pure mathematics as subjects | 17 | 2 | 6 |
| ඉංජිනේරු තාක්ෂණවේදය | 6 | ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 14 | 0 | 0 |
| ජෛව පද්ධති තාක්ෂණවේදය | 7 | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 6 | 2 | 0 |
| තාක්ෂණවේදය සඳහා විද්‍යාව | 8 | භෞතික විද්‍යාව විෂය සඳහා දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් මෙම විෂය සඳහා ද අදාලවන අතර, ප්‍රධාන විෂය ලෙස භෞතික විද්‍යාව අනිවාර්ය වේ. අමතර සුදුසුකමක් ලෙස රසායන විද්‍යාව, ජීව විද්‍යාව හදාරා තිබීම සලකා බැලේ. | 12 | 1 | 0 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 9 | තොරතුරු තාක්ෂණය උපාධිය හෝ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් | 62 | 3 | 4 |
| ඉංග්‍රීසි | 10 | B. A. (English as a major subject) Bachelor of Education (TESL) | 4 | 2 | 1 |
| අරාබි | 11 | Bachelor of Arts or Bachelor of Education Degree with the specific subject as the major subject in the degree | 0 | 1 | 0 |
| ප්‍රංශ | 12 | Bachelor of Arts or Bachelor of Education Degree with the specific subject as the major subject in the degree | 2 | 0 | 0 |
| චීන | 13 | Bachelor of Arts or Bachelor of Education Degree with the specific subject as the major subject in the degree | 3 | 0 | 0 |
| ජපන් | 14 | Bachelor of Arts or Bachelor of Education Degree with the specific subject as the major subject in the degree | 11 | 0 | 0 |
| ජර්මන් | 15 | Bachelor of Arts or Bachelor of Education Degree with the specific subject as the major subject in the degree | 1 | 0 | 1 |
| හින්දි | 16 | Bachelor of Arts or Bachelor of Education Degree with the specific subject as the major subject in the degree | 1 | 0 | 0 |

| විෂයය | විෂයය අංකය | අධ්‍යාපන සුදුසුකම් | මාධ්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | ඉංග්‍රීසි මාධ්‍ය |
| ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය | 17 | ළමා මනෝ විද්‍යාව විෂයයක් ලෙසට හැදෑරූ උපාධියක් හෝ ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 12 | 2 | 0 |
| සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | 18 | සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී (විශේෂ) උපාධිය හෝ සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 2 | 0 | 0 |
| ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | 19 | ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපන) විශේෂ උපාධිය හෝ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 8 | 3 | 0 |
| ප්‍රාසංගික කලාව | 20 | ප්‍රාසංගික කලාව පිළිබඳ විශේෂ උපාධිය හෝ ශාස්ත්‍රවේදී - විශේෂ (ප්‍රාසංගික කලා/ලලිත කලා/නර්තනය/සංගීත) උපාධිය හෝ නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය හෝ අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලාව) උපාධිය හෝ ප්‍රාසංගික කලාව හෝ ලලිත කලාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ විශේෂ උපාධියක් | 2 | 2 | 0 |
| කාර්ය සිද්ධි කළමණාකරණය | 21 | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ කාර්ය සිද්ධි කළමනාකරණය පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ කාර්ය සිද්ධි කළමනාකරණය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධියක් | 12 | 0 | 0 |
| ශිල්ප කලා | 22 | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර, මූර්ති, මුද්‍රණ කලා රෙදිපිළි හා රෙදිපිළි ආශ්‍රිත කලා ආදී) හෝ දෘශ්‍ය කලා හා සැලසුම්කරණය විශේෂ උපාධිය (චිත්‍ර කලා සහ ග්‍රැෆික්)හෝ දෘශ්‍ය හා තාක්ෂණ කලා විශේෂ උපාධිය හෝ ශාස්ත්‍රවේදී හෝ ලලිතකලාවේදී හෝ විශේෂ උපාධිය - (චිත්‍ර කලා/ ග්‍රැෆික්/මූර්ති/දෘෂ්‍ය හා තාක්ෂණික කලා යන විෂයයන් හෝ එක් විෂයයක් හෝ ප්‍රධාන ලෙස හදාරා තිබිය යුතුය) | 8 | 2 | 0 |
| අභ්‍යන්තර නිර්මාණකරණය | 23 | ගෘහ නිර්මාණ ශිල්පය සඳහා වූ විද්‍යාවේදී උපාධිය හෝ නිර්මාණවේදී උපාධිය හෝ ගෘහ නිර්මාණ ශිල්පය සඳහා පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය හෝ අභ්‍යන්තර නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 14 | 4 | 0 |
| විලාසිතා නිර්මාණකරණය | 24 | නිර්මාණවේදී උපාධිය හෝ දෘශ්‍ය කලා විශේෂ උපාධිය (රෙදිපිළි හා ඇඟලුම් කලා) හෝ විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය හෝ විලාසිතා නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 11 | 4 | 0 |
| ග්‍රැෆික් නිර්මාණකරණය | 25 | නිර්මාණවේදී උපාධිය හෝ දෘශ්‍ය කලා හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (චිත්‍ර සහ ග්‍රැෆික්) හෝ පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඇතුළත් උපාධියක් හෝ පරිගණක විද්‍යාව විෂයය ඇතුළත් විද්‍යාවේදී උපාධිය හෝ (ඉහත සඳහන් උපාධි පාඨමාලාවෙන් 1/3 ක වටිනාකමකින් යුත් ග්‍රැෆික් නිර්මාණකරණය සහිත විෂයය කොටස් හදාරා සමත් වී තිබිය යුතුය.) ග්‍රැෆික් නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 7 | 5 | 0 |
| භූ දර්ශන නිර්මාණකරණය | 26 | කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධිය (උද්‍යාන විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ උද්‍යාන විද්‍යාව, මල්වගාව හා භූ දර්ශනය පිළිබඳ ප්‍රථම උපාධිය | 4 | 2 | 0 |
| ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | 27 | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (උද්‍යාන විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ උද්‍යාන විද්‍යාව, මල්වගාව හා භූ දර්ශනය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 1 | 0 | 0 |

| විෂයය | විෂයය අංකය | අධ්‍යාපන සුදුසුකම් | මාධ්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | ඉංග්‍රීසි මාධ්‍ය |
| පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | 28 | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (සත්ව විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය හෝ සත්ත්ව පාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 5 | 1 | 0 |
| ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | 29 | ආහාර විද්‍යාව හා තාක්ෂණවේදය ප්‍රථම උපාධිය හෝ ආහාර විද්‍යා තාක්ෂණය විශේෂ උපාධිය හෝ ආහාර විද්‍යා පෝෂණය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ විද්‍යාවේදී ප්‍රථම උපාධිය සමග ආහාර විද්‍යා තාක්ෂණ විද්‍යාපති උපාධිය හෝ කෘෂි විද්‍යාවේදී ආහාර විද්‍යා තාක්ෂණය විශේෂ උපාධිය (මුළු විෂය මාලාවේ 60% නොඅඩු ආහාර විද්‍යාව හා තාක්ෂණවේදයට සම්බන්ධ විෂය අන්තර්ගතයක් තිබිය යුතුය). විද්‍යාවේදී ආහාර විද්‍යා හා තාක්ෂණ විශේෂ උපාධිය (මුළු විෂය මාලාවේ 60% නොඅඩු ආහාර විද්‍යාව හා තාක්ෂණවේදයට සම්බන්ධ විෂය අන්තර්ගතයක් තිබිය යුතුය). කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (ආහාර විද්‍යාව හා තාක්ෂණ විශේෂීකරණය සහිතව) හෝ ආහාර නිෂ්පාදන තාක්ෂණය හෝ ආහාර සැකසුම් තාක්ෂණවේදී උපාධියක් | 11 | 12 | 0 |
| ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | 30 | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (ජලජීවී විද්‍යාව පිළිබඳ විශේෂීකරණය සහිතව) හෝ ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස ජලජ සම්පත් කළමනාකරණය විෂයය ඇතුළත් ප්‍රථම උපාධිය හෝ ජලජ සම්පත් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 3 | 1 | 0 |
| වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | 31 | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ අපනයන කෘෂිකර්මය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ වැවිලි බෝග නිෂ්පාදනය තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 13 | 1 | 0 |
| ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | 32 | සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය ඇතුළත් ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ ඉදිකිරීම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 27 | 2 | 0 |
| මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | 33 | තාක්ෂණවේදී උපාධිය (මෝටර් යාන්ත්‍රික) හෝ විද්‍යාවේදී ඉංජිනේරු (මෝටර් යාන්ත්‍රික) උපාධිය හෝ මෝටර් යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 31 | 6 | 0 |
| විදුලිය හා ඉලක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | 34 | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉංජිනේරු තාක්ෂණවේ දී උපාධිය හෝ ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 31 | 11 | 0 |
| පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | 35 | නිර්මාණවේදී උපාධිය හෝ පේෂකර්ම හා රෙදිපිළි පිළිබඳ ඉංජිනේරු ප්‍රථම උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 21 | 4 | 0 |
| ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | 36 | තාක්ෂණවේදී උපාධිය යාන්ත්‍රික (සාමාන්‍ය) හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය (සාමාන්‍ය) ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධිය හෝ ලෝහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 14 | 4 | 0 |
| ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | 37 | තාක්ෂණවේදී උපාධිය (සිවිල් / ඉදිකිරීම්/ යාන්ත්‍රික) හෝ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 19 | 2 | 0 |

| විෂයය | විෂයය අංකය | අධ්‍යාපන සුදුසුකම් | මාධ්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | ඉංග්‍රීසි මාධ්‍ය |
| පරිගණක දෘඩාංග සහ ජාලකරණය | 38 | වසර තුනක කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළව මුළු උපාධි පාඨමාලාවෙන් 1/5 ක වටිනාකමක් සහිත විෂය කොටස් හදාරා සමත් වී තිබීම) හෝ වසර හතරක කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළ මුළු උපාධි පාඨමාලාවෙන් 15 %ක වටිනාකමක් සහිත විෂය කොටස් හදාරා සමත් වී තිබීම) හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී/ තාක්ෂණවේදී/උපාධිය සමඟ තොරතුරු තාක්ෂණය/ පරිගණක තාක්ෂණය/ පරිගණක දෘඩාංග/ පරිගණක ජාලකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (එම පශ්චාත් උපාධිය සඳහා මුළු විෂය කොටස්වලින් 1/5 ක වටිනාකමක් සහිතව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර හදාරා සමත් වී තිබීම)<br>විෂය ක්ෂේත්‍ර<br>(i) Computer Hardware<br>(ii) Computer system Engineering<br>(iii) Computer Networks<br>(iv) Computer Architecture<br>(v) Operating System<br>(vi) Electronics<br>(vii) Arduino Technology<br>(viii) IT Security<br>(ix) Network Security<br>(x) Information Security<br>(xi ) Cyber Security<br>(xii) Computer Hardware and Network related Project | 6 | 5 | 0 |
| නිෂ්පාදනය | 39 | වසර තුනක කාලයකින් යුත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධියක් | 11 | 0 | 0 |
| සංචරණය හා ආගන්තුක සත්කාර | 40 | ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය පිළිබඳව පරිපාලනවේදී උපාධිය හෝ විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය හෝ විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය හෝ ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සිද්ධි පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ සංචාරක කළමනාකරණ විශේෂවේදී උපාධිය හෝ සංචාරක කළමනාකරණ උපාධිය හෝ සංචාරක සහ සංස්කෘතික සම්පත් කළමනාකරණ උපාධිය හෝ සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් | 12 | 11 | 0 |
| සැපයුම් කළමනාකරණය | 41 | උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස සැපයුම් කළමනාකරණය විෂයය ඇතුළත් උපාධියක් | 7 | 0 | 0 |
| අලෙවිකරණය | 42 | අලෙවි කළමනාකරණය පිළිබඳව හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව හෝ කළමනාකරණය පිළිබඳ උපාධිය හෝ වාණිජවේදී උපාධියක් හෝ ප්‍රධාන විෂයයක් ලෙස අලෙවි කළමනාකරණය ඇතුළත් උපාධියක් | 13 | 3 | 0 |

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)

2023 අගෝස්තු මස 09 වැනි දින දී ය,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

ආදර්ශ අයදුම්පත

(යොමු අංකය)

බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I(අ) ශ්‍රේණියට බඳවා ගැනීම - 2023

Recruitment of Graduates to Grade I (A) of Class 3 of the Sri Lanka Teachers' Service for Sinhala, Tamil and English Medium Vacancies existing in Western Province Provincial Councils Schools - 2023

1. භාෂා මාධ්‍යය :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :————.

3. උපන් දිනය :————. වයස :————.

4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
(ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය විභාගය සඳහා පෙනී සිටින දිස්ත්‍රික්කය ලෙස සලකනු ලැබේ.)

5. බස්නාහිර පළාත තුළ **2023.08.25** දිනට අඛණ්ඩ ස්ථිර පදිංචිය ඃ අවුරුදු :————. මාස :————. දින :————.

6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

7. විභාගය සඳහා ගෙවීම කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා කුවිතාන්සියේ අංකය :————. බප 1-

| |
|---|
| මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත නොගැලවෙන පරිදි මෙහි අලවන්න. |

8. සම්පූර්ණ නම (සිංහලෙන්)

.........................................................................................................

8.1. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

.........................................................................................................

8.2. මුලකුරු සමඟ නම (සිංහලෙන්) මයා /මිය /මෙනවිය

.........................................................................................................

8.3. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

.........................................................................................................

9. විෂයය :————.

10. අයදුම්කරුගේ ස්ථිර ලිපිනය :................................

10.1. විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :........................

11. තොරතුරු දැනුම් දීම සඳහා භාවිතයේ ඇති ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

12. විද්‍යුත් තැපැල් ලිපිනය :————.

13. අධ්‍යාපන සුදුසුකම්- අ.පො.ස (සා/පෙළ) ප්‍රතිඵල ෘ

| අ.පො.ස.(සා.පෙළ) විභාගය | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය ...........<br>වර්ෂය ........... | | | විභාග අංකය .......................<br>විභාග අංකය ....................... | | |
| විෂයය | සාමර්ථය | වර්ෂය | විෂයය | සාමර්ථය | වර්ෂය |
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

14. අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල ෘ

| වර්ෂය ............................ | විභාග අංකය ............ |
|---|---|
| විෂයය | සාමාර්ථය |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

15. උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර ෘ

15.1 උපාධිය :————.
15.2 නිකුත් කළ විශ්වවිද්‍යාලය :————.
15.3 උපාධිය වලංගු දිනය :————.
15.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් :————.
15.5 උපාධිය ලබා ඇති මාධ්‍යය :————.

16. ඔබ ආබාධිත තත්ත්වයක් යටතේ අයදුම්කරන්නෙක්ද ? :————.

16.1 ඔබ ඡෙද අංක 16 යටතේ අයදුම්කරන්නේ නම්, බ්‍රේල් මාධ්‍යය යටතේ විභාගය සඳහා පෙනී සිටින්නෙක්ද? :————.

16.2 ඒ අනුව ඔබගේ ආබාධිත තත්ත්වය පිළිබඳව සඳහන් කරන්න.(පහතින් දක්වා ඇති තිත් ඉරි පේළි මත සඳහන් කරන්න.)

........................................................................................................................................................................................

(පහතින් දක්වා ඇති කොටස්වල තොරතුරු අයදුම්කරු තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුවේ.)

17. අයදුම්කරු රජයේ සේවයේ යෙදී සිටිය දී අයදුම් කරන්නේ නම්,

17.1 දැනට දරන තනතුර :————.
17.2 එම තනතුරට පත් කළ දිනය :————.
17.3 ආයතන ප්‍රධානියාගේ නිල නාමය :————.
17.4 සේවය කරන ආයතනය :————.
17.5 ආයතනයේ ලිපිනය :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි. මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

මුලකුරු සමඟ අයදුම්කරුගේ නම :————.
ලිපිනය :————.
අයදුම්කරුගේ අත්සන :————.
දිනය :————.

18. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ........... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

දිනය :————.

————,
අත්සන සහතික කරන නිලධාරිගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

19. අයදුම්කරු රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

.......................................................................................................මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08-730

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.